# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

## නීතිපති දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ තනතුර සඳහා බඳවා ගැනීම - 2024

නීතිපති දෙපාර්තමේන්තුවේ, කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ තනතුරුවල පවතින පුරප්පාඩු **05** ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. නීතිපති දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් අයදුම්පත්‍ර බාගත කරගත හැකි අතර, අයදුම්පත්‍ර පහත සඳහන් දිනට හෝ ඊට පෙර නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, තැ.පෙ. 502, කොළඹ 12 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ ඉහළ වම් කෙළවරේ "කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ තනතුර සඳහා අයදුම් කිරීම - 2024" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2024.06.10** දින වේ.

***සටහන*** **:** අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය. මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගෙන් ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර අසම්පූර්ණ අයදුම්පත්‍ර ද දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

   නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ප්‍රථම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 50ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින්, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් අවසාන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසාන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙළ මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා සේවා අවශ්‍යතාවය අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 09 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව ප්‍රථම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

   පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :
   - i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.
   - ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් ය.
   - iii. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතු ය.
   - iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදු කර ඇති සංශෝධනයන් හි ඇතුළත් කොන්දේසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය* :-
   මෙම තනතුරට AGS 1-2016, රු.47,615-10x1,335- රු. 60,965/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

4. *අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම්* :
   ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම හා නොතාරිස් ආඥාපනත යටතේ නිකුත් කරන ලද වලංගු නොතාරිස් බලපත්‍රයක් තිබීම.

ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

5. පළපුරුද්ද :
ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

6. වයස් සීමාව :
අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 40ට නොවැඩි වීම.

7. කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරෙහි රාජකාරී මැනවින් ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් ද යුක්ත විය යුතුය.

8. වෙනත් සුදුසුකම් :
   i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
   ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය. (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගෙන් ලබාගත් චරිත සහතික ඉදිරිපත් කළ යුතුය.)
   iii. ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරුවෙකු වී නොතිබිය යුතුය.
   iv. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, එනම් **2024.06.10** දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

9. ප්‍රථම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

I. ප්‍රථම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *අනු අංකය* | *ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | **අධ්‍යාපන සුදුසුකම් :** | | |
| | i. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය පළමු පෙළ ගෞරව සාමාර්ථය; | 08 | |
| | ii. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) පළමු පෙළ සාමාර්ථය; | 07 | |
| | iii. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය දෙවන පෙළ ගෞරව සාමාර්ථය; | 06 | |
| | iv. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ ඉහළ සාමාර්ථය; | 06 | 20 |
| | v. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ පහළ සාමාර්ථය; | 05 | |
| | vi. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB); | 04 | |
| | vii. ශ්‍රී ලංකා නීති විද්‍යාලය මගින් පිරිනමනු ලබන අදාළ ක්ෂේත්‍රයේ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්; | 03 | |
| | viii. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන අදාළ ක්ෂේත්‍රයේ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්; | 02 | |
| | ix. රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමනු ලබන නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය. | 03 | |
| | **රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයක් යනු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් වේ.** | | |
| | (ඉහත සඳහන් සියළුම කුසලතාවයන් උපරිම ලකුණු 20 කට සීමා වේ.) | | |
| | *ඉහත අධ්‍යාපන සුදුසුකම් සහතික මගින් සනාථ කළ යුතුය. | | |

| අනු අංකය | ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | වෘත්තීය පළපුරුද්ද :<br>i. ලේඛනගත නීතිඥවරයෙකු ලෙස සක්‍රීයව හා සාර්ථකව කටයුතු කර තිබීම. (එක් අවුරුද්දක් සඳහා ලකුණු 02 බැගින්);<br>ii. රජයේ හෝ පිළිගත් නීති ආයතනයක ලේඛනගත නීතිඥවරයෙකු ලෙස සක්‍රීයව හා සාර්ථකව කටයුතු කර තිබීමෙන් දක්වන ලද කුසලතා.<br>(ඉහත සඳහන් කුසලතා සඳහා සහතික ඉදිරිපත් කළ යුතුය.)<br><br>**සටහන:**-විනිශ්චයකාරවරයෙකුගෙන් වෘත්තීය හැකියාව පිළිබඳ සහතිකයක් සහ අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරුන් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික ඉදිරිපත් කළ යුතුය. **නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් නිකුත් කරන ලද චරිත සහතික අදාළ නොවේ.** | 10<br><br>10 | 20 |
| 03. | **විශේෂ දක්ෂතා :**<br>i. සන්නිවේදන කුසලතාවය<br>ii. හිටිවන කථිකත්වයේ කුසලතාවය<br>iii. සභාව ඉදිරියේ සාර්ථකව පෙනී සිටීමේ කුසලතාවය<br>iv. භාෂාව හැසිරවීමේ හැකියාව | 05<br>05<br>05<br>05 | 20 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා :<br>i. පෞරුෂත්වය<br>ii. ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව<br>iii. නායකත්ව ගුණාංග<br>iv. නීතිය හා අධිකරණ කටයුතු පිළිබඳව ඇති දැනුම | 05<br>15<br>05<br>15 | 40 |
| | එකතුව | | 100 |

II. අවසාන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| I. තර්ක ශක්තිය<br>II. කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව<br>III. ප්‍රශ්නවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව<br>IV. මූලික නෛතික සිද්ධාන්ත දැනුම | 25<br>25<br>25<br>25 |
| එකතුව | 100 |

10. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**
යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**සැලකිය යුතුය :**

අ. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 9-I හි අනු අංක 01 හා 02 යටතේ පිළිවෙළින් දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතික පත් හා ලියවිලිවල සහතික කරන ලද පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.

ආ. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික හා ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

11. **සාවද්‍ය තොරතුරු සැපයීම:-**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

13. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

නීතිපති.
2024 අප්‍රේල් මස 30 වැනි දින,
උපරිමාධිකරණ සංකීර්ණය,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.